මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
|---|---|
| දිනය | 2024 නොවැම්බර් 07 |

**ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹෙයි.**

මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම, සහ ඒ ආශ්‍රිත අපරාධ සහ ඊට සම්බන්ධ ඕනෑම පුද්ගලයෙකු පිළිබඳ විමර්ශන සහ නඩු පැවරීම්, පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා 2024 නොවැම්බර් 04 වැනි දින ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සමඟ අවබෝධතා ගිවිසුමකට ශ්‍රී ලංකා මහ බැංකුවේ දී එළැඹිණි. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදන අනුව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මෙම අවබෝධතා ගිවිසුමට එළැඹෙන ලදී.

රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්‍ෂ ජනරාල් සහ රෙජිස්ට්‍රාර් සංජීව විමලගුණරත්න මහතා සහ මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ආචාර්ය සුභානි කීර්තිරත්න මහත්මිය අදාළ ආයතන වෙනුවෙන් අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා ඉදිරියේ මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති කේ එම් ඒ එන් දවුලගල මහත්මිය හා සහකාර අධිපති ඊ එච් මොහොට්ටි මහත්මිය ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ඒ ආශ්‍රිත අපරාධ සඳහා රාජ්‍ය නොවන සංවිධාන අනිසි ලෙස භාවිතා කළ හැකි අතර, එමගින් ජාතික සහ ගෝලීය ආර්ථික හා මූල්‍ය පද්ධතිවල ස්ථාවරත්වයට තර්ජනයක් ඇතිවිය හැකිය. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම, ඒවායේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, එම සංවිධාන සඳහා පහසුකම් සැපයීම, සහ එම සංවිධානවල විෂමාචාර හැසිරීම්වලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම යනාදී සේවාවන් සපයයි. මෙම අවබෝධතා ගිවිසුම මගින් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් හෝ එවැනි ක්‍රියාකාරකමකට සම්බන්ධ ඕනෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් සිදුවන ඕනෑම සිදුවීමක්, විමර්ශනයක් හෝ නඩු පැවරීමක් පිළිබඳ තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය සමඟ හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසෙනු ඇති අතර, එය මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ඒ ආශ්‍රිත අපරාධ වැළැක්වීම, අනාවරණය කර ගැනීම සහ එම වැරදි සම්බන්ධයෙන් විමර්ශනය කර නඩු පැවරීම සඳහා ඉතා වැදගත් වනු ඇත.

මෙම අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමත් සමඟ, මූල්‍ය බුද්ධි ඒකකය, මෙරට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමේ අරමුණින් දේශීය රාජ්‍ය ආයතන 16 ක් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹ ඇති අතර ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා පොලිසිය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව අනෙකුත් රාජ්‍ය ආයතන අතර වේ. එසේම, මූල්‍ය බුද්ධි ඒකකය විදේශීය පාර්ශ්ව 45 ක් සමඟ ද අවබෝධතා ගිවිසුම්වලට එළැඹ ඇත.




රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් සංජීව විමලගුණරත්න මහතා සහ මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ආචාර්ය සුභානි කීර්තිරත්න මහත්මිය, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා ඉදිරියේ දී අවබෝධතා ගිවිසුම හුවමාරු කරන අවස්ථාව.